# යාල්පාන වෛපවමාලයෙන් හෙළිවන
# යාපා පටුනේ සිංහල බෞද්ධ උරුමය

(සුමේධ වීරවර්ධන, සහකාර කථිකාචාර්ය, දර්ශන හා මනෝවිද්‍යා අංශය,
පේරාදෙණි විශ්වවිද්‍යාලය.)

**යාල්පාන වෛපවමාලය** ලියැවුණේ ක්‍රි.ව. 1736 දී මයිල්වාහනම් පුලවර් නම් මහතකු විසිනි. ඊට ආරාධනා කරන ලද්දේ එවකට ලංකාවේ ලංදේසි ප්‍රදේශවල ආණ්ඩුකාරවරයා විසින් ය. යාල්පාන වෛපවමාලයට අනුව ශ්‍රී ලංකාවේ සෑම කාලයක ම සිටි රජවරු දෙමළ අය වෙති. දෙමළ ඉතිහාසඥයන් උත්සාහ කළේ, මෙරට සිටි රජවරු දෙමළ බව පවසා මෙරට තිබුණේ දෙමළ රාජධානියක් බව පෙන්වීමට පුවලර් මහතා විසින් අනුගමනය කළ විධික්‍රමය වූයේ එයයි. සයිමන් කාසිචෙට්ටි විසින් මෙරට සිංහලයන්ට තමන්ගේ වර්ගයේ රජවරු නොසිටි බව කියන්නේත්, සිංහල බ්‍රාහ්මී අක්ෂර සහිත ආනෙයිකෝට්ටේ ලෝහ මුද්‍රාව දෙමළ රජකුගේ එකක් බව මහාචාර්ය කාර්තිගේසු ඉන්‍ද්‍රපාලන් වැරදියට විග්‍රහ කරන්නේත්, දේවානම් පියතිස්ස රජු, දේවානම්ප්‍රියතීෂන් බවට සචි පොන්නම්බලන් මහතා විසින් පත්කර ඇත්තේත්, පුලවර් මහතාගේ ක්‍රමවේදය ඉදිරියට ගෙන යමිනි.

යාල්පාන වෛපවමාල කතුවරයා මෙරට පැවති දෙමළ රාජධානියක් ගැන කීමට උත්සාහ කර ඇතත්, එම කෘතිය තුළින් ද පැහැදිලි වන්නේ යාපා පටුනේ පැවති සිංහල බෞද්ධ උරුමය යි. ශ්‍රී ලංකාවේ මුල් කාලීන ඉතිහාසය සම්බන්ධයෙන් එහි දක්වා ඇති බොහෝ කරුණු හුදු මිථ්‍යා කතාවක් බව පෙනෙන අතර විශේෂයෙන් ම කෝට්ටේ ගම්පොල යුගවලින් පසුව එහි කියැවෙන බොහෝ කරුණු අනෙකුත් සාධක සමඟ සංගත වන බව පෙනේ.

විජය පුරාවෘත්තය පුලවර් මහතා ද පිළිගෙන ඇත. එහෙත් ඔහු කිසිම හේතුවක් නොදක්වා පවසන්නේ විජය රජු හිංදු භක්තිකයෙකු වන බවත්, ශ්‍රී ලංකාවේ සිවු කොනේත්, තවත් බොහෝ තැන්වලත් හිංදු දේවාල රාශියක්, විජය රජු විසින් ගොඩනැගූ බවත් ය. පුලවර් මහතා පවසන පරිදි ශ්‍රී ලංකාවේ ජනාවාස ඇති කිරීම සඳහා ඉන්දියාවෙන් ජනයා ගෙන ඒමට අවශ්‍ය විය. එහෙත් කන්‍යාකුමාරි තුඩුවේ සිට හිමාලය දක්වා විසූ එකද හිංදු බැතිමතෙකුවත් ලක්දිවට ඒමට අකමැති වී ඇත. මක්නිසාදයත් හිංදු බැතිමතුන් විසින් ශ්‍රී ලංකාව රාක්ෂයන්ගේ දේශය යැයි පිළිකුල් කළ හෙයිනි. ඉන් පසු ලංකාව ජනාවාස කිරීම සඳහා සියම් දේශයෙන් බෞද්ධයන් ගෙන ඒමට විජය රජුට සිදු වූ බව පුලවර් මහතා මෙසේ පවසයි. **''වේදාරයන් (වැද්දන්) සහ වනසතුන් පමණක් විසූ ලංකාව එකල මහා වන පෙදෙසකි. එහි මිනිස්සු නොවූහ. අදහස් සඵල කර ගත නොහැකි වූ රජ තෙමේ මගධ දේශයෙහි බෞද්ධයන් වෙත තම සැලකිල්ල යොමු කර වීය. මගධයෙහි විසූ බෞද්ධයෝ වනාහි බෞද්ධාගම වැළඳගැනීම නිසා සිය දෙසින් පළවා හරිනු ලැබුවෝ ය. සියම් දේශයට ගිය විජය රාජ හට මෙසේ අතරමං වී සිටි පිරිස්වලින් සමහරකු ස්වකීය රාජධානිය වෙත පමුණුවා ගැනීමට හැකි විය. ලක්දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි පදිංචිය සැලැස්වූ ඔවුනට ස්වකීය ආගම ඇදහීමේ සම්පූර්ණ**

**නිදහස ද හෙතෙම දුන්නේ ය. මෙසේ කල් යත් යත් ඒ බෞද්ධ පිරිස සිංහල නමින් හැඳින්වුණු. සිංහල නම් අළුත් නාමය ලැබීමට හේතුව වූයේ සිංහලෙහි වැසියන් වූ නිසා ය. ලංකාවට තවත් නමක් සිංහලය යනුයි.''**

පොළොන්නරු යුගයෙන් පසු යාපනයේ ස්වාධීන රාජ්‍යයක් ඇරඹිණි. එතැන් සිට පෘතුගීසින් යාපනය අල්වා ගන්නා තෙක් යාපනය සිංහ ආරියන්වරු දහතුන්දෙනෙක් විසින් පාලනය කර ඇති බව පෙනේ. මොවුන් කාලිංග දේශයෙන් හෙවත් ඔරිස්සාවෙන් පැමිණි මාඝගේ පරපුරට අයත් වූවෝ මිස දෙමළ රජවරු නොවෙති. එබැවින් ශ්‍රී ලංකාවේ ආක්‍රමණික චෝල රජවරුන් කීපදෙනෙක් හැර එකම දෙමළ රජෙකු වත් ලංකාව හෝ ලංකාවේ ප්‍රදේශයක් පාලනය කර නැත. සෙනරත් පරණවිතාන, විමල විජයසූරිය, අභය ආර්යසිංහ, පී. වීරසිංහ යන විද්වතුන්ගේ පර්යේෂණ ලිපි කියවීමෙන් මේ පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය.

ත්‍රී සිංහලයේ පාලකයා වූ මහරජුගෙන් ස්වාධීන ව යාපනය ප්‍රදේශය පාලන කළ සිංහ ආරියන්වරුන්ට, යාපා පටුන්වාසී සිංහල බෞද්ධයනගේ සහයෝගය නොලැබිණි. එබැවින් සිංහල බෞද්ධ ජනගහනය තුනී කිරීම සඳහා දෙමළ පවුල් බොහෝ ගණනක් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා යාපනයේ පදිංචි කළේ මේ සිංහ ආරියන්වරුන් විසිනි. තවද සිංහල රජවරුන් සමඟ සටන් කිරීම සඳහා සොළී සේනාවන් ගෙන ආවේ ද යාපාපටුන් වාසී සිංහල බෞද්ධයන් සිංහ ආරියන්වරුන්ට අවනත නොවූ බැවිනි.

ක්‍රි.පූ. යුගයේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා ම යාපනය පාලනය කළේ (අවස්ථා කීපයක දී ම දෙමළ ආක්‍රමණිකයින් එම ප්‍රදේශ පාලනය කළ බවට සාධක ඇතත් නොබෝ කලකින් සිංහල රජවරුන් විසින් ඔවුන් පලවා හරින ලදි.) සිංහල පාලකයින් විසිනි. එම කාලයේ දී රජු සිංහල බෞද්ධ වූ අතර රාජ්‍ය භාෂාව සිංහල වූවා පමණක් නොව යාපනයේ රාජ්‍ය ආගම වූයේ ද බුදුදහම ය. පොළොන්නරු යුගයෙන් පසු සිංගෙයි (සිංහ) ආරියන්වරු පාලකයින් වූ අතර ඔවුන්ගේ පරපුරේ අවසාන පාලකයා වූ සංකිලි රජුගේ කාලය තෙක් ම යාපාපටුනේ සිංහල බෞද්ධයෝ වාසය කර ඇතිවා පමණක් නොව, හැකි සෑම අවස්ථාවකදී ම ඔවුන් සිංහ ආරියන්වරුන්ගේ පාලනයට එරෙහි වූහ. අවම වශයෙන් එක් අවස්ථාවකදී වත් සිංහල බෞද්ධ පාලනයට යාපනය නැවතත් යටත් විය. ඒ හයවැනි පරාක්‍රමබාහු මහරජුගේ සමයේ දී ය. සපුමල් කුමරු විසින් යාපනය පාලනය කරන ලද්දේ එම වකවානුවේදී ය.

සෙංකඩගලපුරයේ රජ කළ ජයතුංග වරරාජසිංහ නමැති රජෙකු විසින් වීරරාඝවන් නම් අන්ධ කවියෙකුට යාපන ප්‍රදේශය තෑගි දුන් බව යාල්පාන වෛපවමාලය කියයි. පළමුවෙන් යාපනයේ විසූ සිංහලයන්ට අමතර ව දකුණු ඉන්දියාවෙන් ගෙන ආ ද්‍රවිඩයන් යාපනයේ පදිංචි කරන ලද්දේ ඔහු විසිනි. ඒ බව පහත දැක්වෙන යාල්පාන වෛපවමාල පාඨයෙන් පැහැදිළි වේ.

**''අන්ධ කවියා විසින් දකුණු ඉන්දියාවෙන් ද්‍රවිඩ පවුල් බොහෝ ගණනක් ගෙන්වා යාපාපටුනේ ඒ ඒ තැන පදිංචි කරවනු ලැබී ය. පිටතින් පැමිණ අලුතෙන් ජනපද පිහිට වූ ද්‍රවිඩයන්**

**මෙන් ම සිංහල ස්වදේශිකයන්ට ද එක සේ සංග්‍රහ කළ ඒ අධිපති තෙමේ සමෘද්ධිමත් දීර්ඝ පාලන කාලයක් අවසන් කොට ස්වර්ග රෝහණ වූයේ ය.''**

වීරරාඝවන්ගේ මරණින් පසු වික්‍රමසිංහ ආරියන්ගේ කාලයේදීත්, යාපාපටුන් වාසී සිංහල සහ දෙමළ ජනයා අතර ගැටුම් ඇති විය. පසුව කී ගැටුමේ දී සිංහල පිරිසට නායකත්වය දුන්නේ පුංචිබණ්ඩා නම් නායකයෙකි. ඔහු ඇතුලු පිරිසක් එල්ලා මරා දැමුණු අතර සිංහලයින් බොහෝ පිරිසක් යාපනය හැර ගිය බව යාල්පාන වෛපවමාලය කියයි. ඉතිරි වූ අය යාපනයේ පාලකයාට එරෙහිව කුමන්ත්‍රණය කළ බවත් එහි සඳහන් වේ. මාර්තාංඩ සිංහ ආරියන් සහ වීරෝදයසිංහ ආරියන් යන පාලකයින්ගේ කාලයේ දී ද දෙපිරිස අතර ගැටුම් සිදු වී ඇත. අර්ධ ස්වාධීන වන්නි පාලකයින්ගේ සහාය මෙහිදී ලැබී ඇත්තේ සිංහල පක්ෂයට ය. ගුණවීරසිංහ ආරියන්ගේ සමයේ දී ද සිංහලයන් රජුට එරෙහි විය. කණකසූරිය ආරියන් නම් දුර්වල පාලකයා පරදා විජයබාහු නම් සිංහල පාලකයා වසර 17 ක් යාපාපටුන පාලනය කළ බව යාල්පාන වෛපවමාලය පවසයි. (සපුමල් කුමරුගේ ජයග්‍රහණය ගැන පුලවර් මහතා කිසිවක් සඳහන් කර නැත.) පරරාජසේකර ආරියන්ගේ සමයේ දී සිංහලයින් යාපනයේ පාලකයින්ට එරෙහි විය. පසුව සිංහලයින්ට එල්වූ දරුණු පීඩා නිසා ඔවුන් යාපනය හැර මහනුවර රාජධානියට හා වන්නි ප්‍රදේශවලට පලා ගිය බවත්, ඉතිරි වූ අය සිංහ ආරියන්වරුන්ට සුවචව සිටි බවත්, එම කෘතියේ තවදුරටත් සඳහන් වේ. සිංහ ආරියන් පරපුරේ අවසාන පාලකයා වූයේ සංකිලි රජු ය. ඔහුගේ කාලය තෙක් ම සිංහල බෞද්ධයන් වාසය කර ඇති අතර යාපනයේ තිබූ බෞද්ධ සිද්ධස්ථාන කඩා බිඳ දමා සිංහල බෞද්ධයින් එම ප්‍රදේශයෙන් පළවා හැරියේ සංකිලි රජු විසිනි. ඒ බව යාල්පාන වෛපවමාලයේ මෙසේ සඳහන් වේ. **ඔහුගේ කෝපාග්නිය මෙහි දී යොමු වූයේ බෞද්ධ සමය ගතුවන් වෙත ය. බුද්ධාගමය ඇදහූ සිංහලයෝ වූහ. යාපනය රාජධානියෙහි බෞද්ධ සිංහලයෝ බොහෝ ගණනක් විසුවෝ ය. රජ අණින් ඔවුහු සියලු දෙනාම රාජ්‍ය සීමාවෙන් ඉවතට පිටුවහල් කොට එළවා දමනු ලැබූහ. මෙයින් ද නොනැවතුණු ඔහු බෞද්ධ සිද්ධස්ථානයන් කඩා හෙළා විනාශ කර දමන ලදි. අවිචාර සමයෙන් බේරී ගනු සඳහා එකද සිංහලයෙකු නොහැර සියල්ලෝම වන්නිකරයට සහ උඩරට ප්‍රදේශයන්ට පැනගත්තෝ ය. එපමණක් ද නොව යළි කිසිදු කලෙක කිසිවකු හෝ යාපාපටුනට පැමිණියේ නැත.**

පුලවර් මහතා මෙසේ කීව ද වෙනත් මූලාශ්‍රවලින් පැහැදිලි වන්නේ මායාදුන්නේ රජු සහ සංකිලි රජු අතරත් වීදිය බණ්ඩාර සහ සංකිලි අතරත්, පෘතුගීසීන්ට එරෙහි ව සමගි ගිවිසුම් ඇති වූ බව ය. සංකිලි විසින් මුලින් බෞද්ධ වෙහෙර විහාර විනාශ කර යාපනයෙන් සිංහලයන් පන්නා දැමුව ද පසුව සිංහල රජවරුන් සමඟ සාම ගිවිසුම් ඇති කරගන්නට ඇතැයි සිතිය හැක. එහෙත් මායාදුන්නේ රජුට සංකිලි රජු විසින් දන්වා යවා ඇත්තේ බුදුදදහම බේරා ගැනීම සඳහා පෘතුගීසීන්ට එරෙහි ව කරන සටනට තම සහයෝගය ලබා දෙන බව ය. මහාචාර්ය එස්. පද්මනාදන් මහතා පවසන පරිදි සංකිලි විසින් ප්‍රායෝගික ව එය ඉටු කර ඇත. එසේ නම් පෘතුගීසීන් විසින් (මිෂනාරි පූජකයින්ගේ සහයෝගයෙන්) කරන ලද පාපකර්මවලින් සමහරක් සංකිලිගේ ගිණුමට බැර කලා වන්නට ද ඇත. ක්‍රිස්තියානි අධිරාජ්‍යවාදීන්ට එය නුහුරු දෙයක් නොවේ. මක්නිසාදයත් සිංහ ආරින්වරුන්ට සිංහල බෞද්ධයින් දිගින් දිගට ම එරෙහි වූ නමුදු ඒ පාලකයින් විසින් බෞද්ධ වෙහෙර විහාර කඩා දැමූ බවට සාක්ෂි නොමැති හෙයිනි.

මේ අනුව බලන විට පැහැදිලි වන්නේ පොළොන්නරු යුගය අවසාන වන තෙක් ම යාපනයේ පැවැතියේ සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයක් බව ය. අභිලේඛණමය සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් ඒ බව මනාව පැහැදිලි වේ. ඉන් පසුව සිංහ ආරියවරුන්ගේ පාලනයට යාපනය යටත් විය. ඔවුන් කාලිංග වංශිකයන් මිස දෙමළ හෝ ද්‍රවිඩ අය නොවේ. ඔවුන්ගේ පාලන කාලයේ දී සිංහල බෞද්ධයින් විශාල ප්‍රමාණයක් යාපනයේ වාසය කර ඇත. මේ සිංහ ආරියන්වරුන් කාලිංග මාඝගෙන් පැවත එන බවත්, මාඝ යනු නිශ්ශංකමල්ල රජුගේ මුණුබුරෙකු බවත් කියැවේ. සංකිලිගේ කාලයේ දී සියලුම සිංහල බෞද්ධයින් යාපනයෙන් පලවා හැරි බව කියවෙතත් ලන්දේසි මූලාශ්‍රවල සඳහන් තොරතුරුවලින් පැහැදිලි වන්නේ එම යුගයේ දී ද සිංහලයින් තම උරුමය රැක ගැනීම සඳහා ලන්දේසීන්ට එරෙහි වූ බව ය.

දෙවනි රාජසිංහ රජු විසින් ලන්දේසීන්ට යැවූ ලිපියක දක්වා ඇති පරිදි ඔහු යාපාපටුනේ ද රජු වෙයි. ක්‍රි.ව. 1766 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ ලන්දේසීන් සමග ඇති වූ ගිවිසුමේ දී යාපාපටුන හා ඊට අඩුත්තු රටවල් ලන්දේසීන්ට භාර දුන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මිස දෙමළ පාලකයෙකු විසින් නොවේ. දැනට යාපනයේ වාසය කරන නලවාර් සහ කෝවියර් යන කුලවලට අයත් ජනයා තුළ තමා සිංහලයන්ගෙන් පැවත එන බවට දැඩි විශ්වාසයක් ඇත.

**(මේ ලිපිය 2003 ජූලි මස 06 වැනි ඉරිදා දිවයින සංග්‍රහයේ රූපණ අතිරේකයේ පළ විය.)**